සැ. යු. — (i) 2014.06.06 දින පළ වූ අංක 1,866 දරන ගැසට් පත්‍රයේ I:III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,867 - 2014 ජුනි මස 13 වැනි සිකුරාදා - 2014.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 762 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 772 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 777 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූලි මස 04 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජුනි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## හම්බන්තොට ප්‍රාදේශීය සභාව

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | රියැදුරු | 02 | PL 3 -2006(A) | රු. 12,470 - 10 x 130 -10 x 145 - 10x160 - 12 x 170 -රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>B.C.D.G පන්තියේ වාහන පැදවීම පිළිබඳ වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br>වාහන රියැදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>මහා මාර්ග නීති පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය; |
| 02. | විදුලි කාර්මික | 01 | PL2-2006(A) | රු. 12,210 - 130 x 10 -145 x 10 - 160x10 - 170 x 12 -රු. 18,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර අ.පො.ස.(සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06කින් සමත්වී තිබිය යුතුය.<br>(අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) 3 වන මට්ටමේ (NVQ 3)සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NVSC) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තීයට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>පළපුරුද්ද :- අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | PL1-2006(A) | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | අටවන (08) ශ්‍රේණිය සමත් වී තිබීම (9 වසර) |
| 04. | සෞඛ්‍ය කම්කරු | 06 | PL1-2006(A) | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | අටවන (08) ශ්‍රේණිය සමත් වී තිබීම (9 වසර) |

*පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(iii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.
(iv) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.
(v) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර 03 අවසානයේ වැඩ පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2014.06.25 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස සභාපති, හම්බන්තොට ප්‍රාදේශීය සභාව, සිසිලසගම, මිරිජ්ජවිල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර "...................................." යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතිකය ;
3. පදිංචිය සනාථ කිරීම පිණිස ඡන්දහිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ;
4. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
5. මෑතක දී ලබාගත් චරිත සහතික 03ක් (ඉන් එක චරිත සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.) ;
7. පළපුරුද්ද පිළිබඳ සහතික.

ගාමිණී සමරගුණරත්න,
සභාපති,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 26 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව,
සිසිලසගම - මිරිජ්ජවිල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

............................................................... *තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
03. තැපැල් ලිපිනය :——————————.
04. දුරකථන අංකය :——————————.
05. උපන් දිනය: වර්ෂය:—————— . මාසය:—————— . දිනය:—————— .
06. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු:—————— . මාස:—————— . දින:—————— .
08. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
09. විවාහක/අවිවාහක බව:——————————.
10. ජාතිය :——————————.
11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද?, එසේ නම් පරම්පරාවෙන් ද?/ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.
12. අධ්‍යාපන සුදුසුකම් :——————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.
14. ඔබ දැනටමත් හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
    (i) දැනට දරන තනතුර :——————————.
    (ii) එම තනතුරට පත්වූ දිනය :——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද) :———
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේ ද ?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් ඒවා බව මා මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ..................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ....................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————.

තනතුර :——————————.

නිල මුද්‍රාව :——————————.

04-325

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *පොදු සුදුසුකම්* |
|---|---|---|---|---|
| ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 6/2006 අනුව PL2-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත්වීම<br><br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවන්හි (N.V.Q.)අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලැබීම<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය<br><br>විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු යි.<br><br>අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| විදුලි කාර්මික | 01 | රා.ප.ච. 6/2006 අනුව PL2-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | එම | එම |
| කාර්යාල කාර්ය සහායක | 01 | රා.ප.ච. 6/2006 අනුව PL1-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම | එම |
| පුස්තකාල සහායක | 01 | රා.ප.ච. 6/2006 අනුව PL1-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම | එම |
| ආදාහනාගාර සහායක | 01 | රා.ප.ච. 6/2006 අනුව PL 1-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම | එම |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 03 | රා.ප.ච. 6/2006 අනුව PL1-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්වීම | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු යි. |
| රියැදුරු | 01 | රා.ප.ච. 6/2006 අනුව PL3 -2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත්වීම<br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් සහ නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.) | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය<br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |

01. *වෙනත් :*

(i) අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iii) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

(iv) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

02. බඳවා ගැනීමේ ක්‍රමය :

(i) සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.

(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) වැන්දඹු අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද,මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

04. *ඉල්ලුම් කරනු ලබන ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2014.07.31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
04. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,

05. පළපුරුද්ද පිළිබඳ සහතික.
06. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

2013 ඔක්තෝබර් මස 04 වැනි දිනැති ගැසට් පත්‍රය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අය නැවත අයදුම් කළ යුතු නොවේ.

පී. ජී. පියල් රණදේව,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*.................................................................. තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුල'කුරු සමග) :———————————.
02. මුල'කුරු වලින් හැඳින්වෙන නම්:———————————.
03. ස්ථිර පදිංචි ලිපිනය :———————————.
04. දුරකථන අංකය :———————————.
05. දිස්ත්‍රික්කය :———————————.
06. උපන් දිනය: වර්ෂය:—————— . මාසය:—————— . දිනය:—————— .
07. ජාතික හැඳුනුම්පත් අංකය :———————————.
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :———————————.
අවුරුදු:—————— . මාස:—————— . දින:—————— .
09. ස්ත්‍රී/පුරුෂ භාවය :———————————.
10. විවාහක/අවිවාහක බව:———————————.
11. ජාතිය :———————————.
12. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද, එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග :———————————.
13. අධ්‍යාපන සුදුසුකම් :———————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *5.* | |
| *2.* | | *6.* | |
| *3.* | | *7.* | |
| *4.* | | *8.* | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :———————————.
15. ඔබ දැනටමත් අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් ඃ
* දැනට දරන තනතුර :———————————.
* එම තනතුරට පත්වූ දිනය:———————————.
* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද):———————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

———————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————————.

**දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ................................. මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ ...................................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

———————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :———————————.

06-326

## මාතලේ ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මාතලේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2014.07.07 දිනට පෙර "ලේකම්, මාතලේ ප්‍රාදේශීය සභාව, පලාපත්වල" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහල කොටසේ මාතලේ ප්‍රාදේශීය සභාවේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (මාතලේ ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක, අනියම් සේවකයන්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 02 | (රා.ප.ච. 06/2006 (iv) PL-1-2006A වැටුප් කේතය රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | රජය අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| 02 | මාර්ග කම්කරු III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 03 | (රා.ප.ච. 06/2006 (iv) PL-1-2006A වැටුප් කේතය රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගෙයන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම. |
| 03 | කාර්යාල කාර්ය සහායක III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 01 | (රා.ප.ච. 06/2006 (iv) PL-1-2006A වැටුප් කේතය රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගෙයන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම. |
| 04 | පුස්තකාල කම්කරු III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 01 | (රා.ප.ච. 06/2006 (iv) PL-1-2006A වැටුප් කේතය රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගෙයන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම. |
| 05 | ජල කම්කරු III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 01 | (රා.ප.ච. 06/2006 (iv) PL-1-2006A වැටුප් කේතය රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගෙයන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම. |
| 06 | ආදාහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු III පන්තිය (අර්ධ ශිල්පීය සේවක ගණය) | 01 | (රා.ප.ච. 06/2006 (iv) PL-2-2006A වැටුප් කේතය රු. 12,210- 10 x 130 - 10 x 145 10 x 160 - 12 x 170 - රු. 18,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගෙයන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම.<br><br>(ii) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ක් තිබීම. (රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියා /ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන සහතිකයක් ද අනෙකුත් අයදුම්කරුවන් රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 07 | ආදාහනාගාර ක්‍රියාකරු සහයක III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය) | 01 | 6/2006 (iv) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු. 11,730- 120x10 -130x10 145x10 -160x12 රු. 17,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම.<br><br>(ii) ආදාහනාගාර ක්‍රියාකරුවකු හෝ සහයක වශයෙන් පළපුරුද්දක් ලබා තිබීම. විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. (රජය පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද සහතික ඉදිරිපත් කළ යුතු ය.) |
| 08 | විදුලි කාර්මික III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සේවක ගණය) | 01 | 6/2006 (iv)දරන රා.ප.ච. PL-2-2006A වැටුප් කේතය රු. 12,210- 130 x 10 - 145 x 10 160 x 10 - 170 x 12 - රු. 18,600 (4වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග විෂයයන් දෙකකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබීම.<br><br>(ii) *ශිල්පීය නිපුණතාව/ප්‍රවීණතාව*<br><br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම්<br><br>අ. 2 වැනි මට්ටමේ (NVQ2)<br><br>හෝ<br><br>3 වන මට්ටමේ (NVQ 3)සහතිකය ලබා තිබීම ;<br><br>හෝ<br><br>ආ. කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>ඇ. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br><br>හෝ<br><br>ඈ, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>ඉ. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>ඊ. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>වීථිලාම්පු සවිකිරීම පිළිබඳ විදුලි බල මණ්ඩලයෙන් හෝ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳව සහතිකයක් ලබා තිබීම හෝ විදුලි බල මණ්ඩලයේ හෝ අදාළ ක්ෂේත්‍රයේ සේවය කර ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 09 | නළ ළිං කාර්මික III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සේවක ගණය) | 01 | 6/2006 (iv) දරන රා.ප.ච. PL-2-2006A වැටුප් කේතය) රු. 12,210- 130 x 10 - 145 x 10 160 x 10 - 170 x 12 - රු. 18,600 (4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම.<br>III. *ශිල්පීය සුදුසුකම් :-*<br>රජයේ පිළිගත් ආයතනයකින් නල ළිං ක්‍රියාකාරිත්වය සම්බන්ධව ලබා ඇති පුහුණුව (සහතික මගින් සනාථ කළ යුතුය.)<br>IV. *පළපුරුද්ද*<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම. |
| 10 | රියදුරු III පන්තිය (ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවක ගණය) | 04 | (රා.ප.ච. 6/2006 (iv) දරන රා.ප.ච. PL-3-2006A වැටුප් කේතය රු. 12,470 130 x 10 - 145 x 10 160 x 10 - 170 x 12 - රු. 18,860 (4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමඟ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් අවම වශයෙන් සාමාර්ථ ලබා තිබීම.<br>I. *ශිල්පීය නිපුණතා :-*<br>තාරබර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් රථ වාහන හා බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (ඒ පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br>II. *පළපුරුද්ද :-*<br>වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවාව සහතික මගින් සනාථ කළ යුතුය.)<br>(iii) අවම වශයෙන් උස අඩි 05 ක් විය යුතුය.<br>(vi) දිවා රාත්‍රී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයෙන් සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>(v) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය.(ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතුය.)<br>(vi) ට්‍රැක්ටර් රථ, ජල බවුසර් පැදවීම පිළිබඳ හැකියාව තිබිය යුතුය. |

*02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

01. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
02. අයදුම්කරුවන් මාතලේ ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.
03. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (මාතලේ ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ස්ථිර/අනියම්/ආදේශක මත සේවයේ යෙදී සිටින අයට උපරිම වයස අදාළ නොවේ.)
05. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රජයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.
06. දැනටමත් මාතලේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.

*03. බඳවා ගැනීමේ කොන්දේසි :-*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.
2. රියැදුරු තනතුර සඳහා බඳවා ගනු ලැබීමට දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙක්, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ලිඛිත පරීක්ෂණයක් ද පවත්වනු ලබන අතර එම පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

*04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතයි. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

2. පත්වීම් දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.

3. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවන ලද නියෝගවලටද, මධ්‍යම පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා මාතලේ ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.

4. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද මාතලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

5. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

6. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ය.

7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මාතලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*05. ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :-*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
(ii) අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත්
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය
(vi) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය.)
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

එච්. එම්. ටී. බී. හීන්කෙන්ද,
ලේකම්,
මාතලේ ප්‍රාදේශීය සභාව,
පලාපත්වල.

2014 මැයි මස 22 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම
මාතලේ ප්‍රාදේශීය සභාව

................................................................. *තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. මුලකුරු සමග නම :————————.
මුලකුරු වලින් හැඳින්වෙන නම:————————.
02. ස්ථිර පදිංචි ලිපිනය :————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
05. උපන් දිනය: වර්ෂය:——————. මාසය:——————. දිනය:——————.
06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :————————.
අවුරුදු:——————. මාස:——————. දින:——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
08. විවාහක/අවිවාහක බව:————————.
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උත්පත්තියෙන් ද /ලියාපදිංචියෙන්ද යන වග :————————.

10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
අ.පො.ස. (සා.පෙළ) විභාගය : සමත් වර්ෂය:——————————. අංකය:——————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

11. (i) වෙනත් සුදුසුකම් :——————————.
(ii) වෘත්තීය සුදුසුකම් :——————————.
(iii) සේවා පළපුරුද්ද :——————————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :——————————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් /ආදේශක ද යන වග :——————————.
එම තනතුරට පත්වූ දිනය :——————————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :——————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහකිරීමට යටත් වන බව ද දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ...................................... විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම ආයතනයේ ................................. වශයෙන් සේවය කරනු ලබයි. ඔබ ආයතනයේ ස්ථිර පත්වීමක් ලද හොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැක/නොහැක. ඔහු/ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන,

දිනය :——————————.
(නිළ මුද්‍රාව තැබිය යුතුය.)

06-438

---

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් ගෝඝාතකාගාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත්, නම ඉදිරියෙන් සඳහන් වෙළඳසැලෙහි මස් වෙළඳාම කිරීමටත් 2014 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවයන් දැන්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකුට ඔහුගේ/ඇයගේ විරෝධතාවය සඳහා හේතුව දක්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින දහහතරක් (දින 14ක්) ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ආර්. එම්. බන්දුල සෙනෙවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 20 වැනි දින,
ගෙලිඔය පිහිටි උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ගවමස් විකිණීම සඳහා ඉල්ලා ඇති අයගේ නාමලේඛනය*

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම | ඉල්ලුම්කරුගේ ලිපිනය | වෙළඳසැල පිහිටි ස්ථානය | ගෝ ඝාතකාගරය පිහිටි ස්ථානය |
|---|---|---|---|---|
| 01. | මුහම්මදු ඉස්මයිල් මුහම්මදු නිෂාම් මහතා | අංක 207/10, වටදෙණිය, වෙළම්බොඩ | අංක 142, අටලහවත්තතැන්න, වටදෙණිය, වෙළඹිබොඩ | සියඹලාගහමුලවත්ත, වෙළඹිබොඩ. |
| 02. | ජේගු මන්සූර් මුහම්ඩින් අස්මි මහතා | අංක 49/සී, දස්කර, මුරුතගහමුල | අංක 330, බූවැලිකඩ, ලීමගහකොටුව | අංක 28/බී, පල්ලිය පාර, නැකතාවත්ත, කළුගමුව |
| 03. | මන්සූර් මුහම්මදු රිස්මි මහතා | අංක 49/බී, දස්කර, මුරුගහමුල | අංක 62බී, දස්කර, මුරුතගහමුල | අංක 195/1, දවුලගල, හන්දෙස්ස |
| 04. | මොහොමඩ් ෆාරුක් මොහොමඩ් සාදික මහතා | අංක 528/2, නිව්ඇල්පිටිය, ගෙලිඔය | අංක 6/බී, කළුගමුව පාර, ගෙලිඔය | අංක 41/5, කඩුගන්නාව වෙළඳ සැල, කඩුගන්නාව |
| 05. | මුහම්මදු පසූර්දීන් මුහම්මදු සියාන් මහතා | අංක 07, දොඹගොල්ල මුරුතගහමුල | අංක 383, නගුරන්ගේවත්ත, බූවැලිකඩ | අංක 135, හන්දෙස්ස, දවුලගල. |
| 06. | මයිනුදීන් මොහොමඩ් ඉක්බාල් මහතා | අංක 157, පැණිදෙණිය, පේරාදෙණිය | අංක 135, දවුලගල, හන්දෙස්ස | අංක 195, මාහින්ගොඩ, දවුලගල, හන්දෙස්ස |
| 07. | හේන්දෙණිය සම්සුදීන් අබාබාකර් මහතා | අංක 130ඒ, කුරුකුත්තල, කඩුගන්නාව | අංක 130ඒ, කඩුගන්නාව, රැකවල්පොල. | අංක 251/1, රැකවල්පොල, වෙළම්බොඩ. |
| 08. | මුහම්මදු හනීෆා අයිෂා උම්මා මිය | අංක 115, නුවර පාර, වෙළම්බොඩ | අංක 48, නුවර පාර, වෙළම්බොඩ. | සියඹලාගහමුලවත්ත, වෙළම්බොඩ. |
| 09. | මොහොමඩ් සාලි හිර්ෂාඩ් මොහොමඩ් මහතා | අංක 479/3/ 1, කළුගමුව, ගෙලිඔය. | පුවක්වැටියාවත්ත, කළුගමුව පාර, ගෙලිඔය | ඉස්මායිල් හිටිතැන්නහේන, පල්ලේගම, පට්ටියාවත්ත, දෙල්තොට. |
| 10. | මොහොමඩ් අනීස් සාජිත් අහමඩ් මහතා | අංක 29/6, රැකවල්පොල, වෙළම්බොඩ. | අංක 58/බී, කුරදෙනිය පාර, වෙළම්බොඩ. | අංක 252/1, රැකවල්පොල, වෙළම්බොඩ. |
| 11. | මොහොමඩ් සාලි මොහොමඩ් සිද්ධික් මහතා | අංක 490/2/බී, කළුගමුව, ගෙලිඔය | අංක 330, දෙල්ලංග, ගෙලිඔය | පල්ලිය පාර, හේනවත්ත, කළුගමුව. |
| 12. | අන්වර්දීන් මොහොමඩ් හසන් මහතා | දුම්පලංග, හන්දෙස්ස | අංක 211/2, නුවර පාර, දවුලගල. | අංක 252/1, රැකවල්පොල, වෙළම්බොඩ. |
| 13. | අබ්දුල් රෂීඩ් මොහොමඩ් නවාස් මහතා | අංක 41/ඩී/2, එළමල්දෙණිය, මුරුතගහමුල | අංක161, බූවැලිකඩ, ලීමගහකොටුව | අංක 41/5, ගවමස් වෙළඳසැල, කඩුගන්නාව. |
| 14. | අබ්දුල් මුන්නාලිස් මුහම්මදු රියාස් මහතා | අංක 195, මාහිංගොඩ, හන්දෙස්ස | අංක 209, දවුලගල, හන්දෙස්ස | සියඹලාගහමුපවත්ත, 115, නුවරපාර, වෙළඹිබොඩ. |

*එළුමස් වෙළඳ සැල*

| | | | | |
|---|---|---|---|---|
| 01. | මොහොමඩ් සුබයිර් මොහොමඩ් මුස්තාක් මහතා | අංක 426, නව ඇල්පිටිය, ගෙලිඔය | නො. 49, කළුගමුව පාර, ගෙලිඔය | අංක 426, නව ඇල්පිටිය, ගෙලිඔය. |

06-436/1

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

*ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා*

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම | ඉල්ලුම්කරුගේ ලිපිනය | වෙළඳසැල පිහිටා ඇති ස්ථානය | ගෝ ඝාතකාගරය පිහිටි ස්ථානය |
|---|---|---|---|---|
| 01. | එම්. එස්. රිස්නා | අංක133/ඩී, දුම්පල්ලංග හන්දෙස්ස | දවුලගල, හන්දෙස්ස | අංක 133/ඩී, දුම්පල්ලංග, හන්දෙස්ස. |

ආර්. එම්. බන්දුල සෙනෙවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2014 ජනවාරි මස 20 වැනි දින,
ගෙලිඔය පිහිටි උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.


06-436/2

## පාතදුම්බර ප්‍රාදේශීය සභාව

### ප්‍රාදේශීය සභා මාර්ගවල වීථි රේඛා සීමාව පැනවීම

2013ක් වූ ජූනි මස 11 වැනි දින පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා වාර්තාවේ තීරණ අංක 8.1 අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 වැනි හා 24 වැනි වගන්ති ප්‍රකාරව පාතදුම්බර ප්‍රාදේශීය සභාව සතු යම් මාර්ගයක සම්පූර්ණ පළල සහ එම මාර්ගයේ භූ විෂමතා පිහිටීම ද සැලකිල්ලට ගනිමින් මාර්ගයේ මධ්‍ය රේඛාවෙන් එක් පැත්තකට එම මාර්ගයේ සම්පූර්ණ පළල ප්‍රමාණය වන සේ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දෙපසට විහිදෙන පළල ප්‍රමාණය එම මාර්ගයේ වීථි රේඛා සීමාව ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

*උදා* :- අඩි 8ක් පළල මාර්ගයක මාර්ගයේ මධ්‍යයේ සිට එක් පසකට වීථි රේඛා සීමාව අඩි 8ක් වේ.




ඩබ්. එම්. එස්. එස්. බී. වෙලගෙදර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

පාතදුම්බර ප්‍රාදේශීය සභාව,
පිටියේගෙදර වත්තේගම.

06-208/1

---

## පානදුර නගර සභාව

### ත්‍රී රෝද රථ නැවතීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නව ත්‍රී රෝද රථ නැවතුම්පල හා සංශෝධනය කිරීම

අංක 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 157(14අ) උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වැනි වගන්තියෙන් පානදුර නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී නගර සභාව විසින් සාදනු ලැබ 2011.11.29 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ අංක 4.1 දරන යෝජනාවෙන් සම්මත වූ ත්‍රී රෝද රථ නැවතීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3(1) වගන්තිය පරිදි පහත 1 වැනි උපලේඛනයේ දැක්වෙන නව ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එකී ස්ථානයේ නවතා තැබිය හැකි උපරිම ත්‍රී රෝද රථ සංඛ්‍යාව ද එම ව්‍යවස්ථාවේ ම 3(2) වගන්තිය පරිදි පහත 2 වැනි උපලේඛනයේ දැක්වෙන සංශෝධිත ත්‍රී රෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව ද 2013.11.28 දින පැවති විශේෂ සභා රැස්වීමේ දී අංක 6.1.5 (1) හා 6.1.5 (2) යටතේ සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
නගර සභාව, පානදුර.

#### 1 වැනි උපලේඛනය

නව ත්‍රී රෝද රථ නවතා තැබිය යුතු ස්ථාන

| *අනු. අංකය* | *නව පිහිටුවීම් රථ ගාලේ නම* | *පිහිටුවීම* | *රථ ගණන* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 01 | ජනප්‍රිය මාවත මැද | ජනප්‍රිය මාවත පැත්ත වරිපනම් අංක 70 දරන ව්‍යාපාරික ස්ථානය අසල | 04 | DSM/65 |
| 02 | දේශසේවා මාවත | ආතර් වී. දියෙස් මාවත සිට අඩි 24 පසුපසට (පාරේ උතුරු පැත්ත) | 01 | ADM/66 |

#### *2 වැනි උපලේඛනය*

සංශෝධිත ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන

| | | | | |
|---|---|---|---|---|
| 01 | ජනප්‍රිය මාවත නැගෙනහිර පැත්ත | ජනප්‍රිය මාවත උතුර පැත්ත සී. ටී. බී. බස් නැවතුම අසල (පානදුර මෙඩිකල් සෙන්ටර් ඉදිරිපිට) | 06 | DSE/21 |

06-253

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - රඹුක්පිටිය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මාවතකට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරන ලද දින සිට එක් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.


මෙම කාලසීමාව තුළදී මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඕ. පී. රෝහණ බණ්ඩාර,
සභාපති.

2014 මැයි මස 12 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

**උපලේඛනය**

| *අනු අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *පාරේ නම* | *ආරම්භය* | *අවසානය* | *පාරේ දිග හා පළල* | *දෙපස ඉඩම් හිමියන්* | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | *වමේ මායිම්* | *දකුණේ මායිම්* |
| 01 | වැලිගොඩවත්ත | වැලිගොඩවත්ත හන්දියේ සිට කටුකිතුල දක්වා මාර්ගය | වැලිගොඩවත්ත හන්දිය | කටුකිතුල | දිග කි. මී. 06 පළල අඩි 20 | 1. ෂෙම්රොක් වත්ත | 1. අනුර ප්‍රියන්ත සිල්වා |
| | | | | | | 2. පන්සල | 2. එම්. ටී. එම්. සෝමාවතී |
| | | | | | | 3. පී. ටී. කරුණාරත්න | 3. දයාවතී |
| | | | | | | 4. ඩබ්. ඒ. සුජීව උපුල් | 4. පොඩි අප්පුහාමි |
| | | | | | | 5. ආනන්ද විතාන | 5. වී. ඒ. නන්දසිරි |
| | | | | | | 6. තිලක් වික්‍රමආරච්චි | 6. දිසානායක |
| | | | | | | 7. ජේ. පී. හේමලතා | 7. වී. ඒ. රත්නසිරි |
| | | | | | | 8. කේ. ඩබ්. ගාමිණී | 8. නිමල් ජයබාහු |
| | | | | | | 9. සුහද මාවත | 9. ආර්. එම්. සෝමසිරි |
| | | | | | | 10. ක්‍රීඩා පිට්ටනිය | 10. ගුණරත්න බංඩා |
| | | | | | | 11. රංජිත් කහවිට | 11. පාසල |
| | | | | | | 12. පී. බී. රම්බණ්ඩා | 12. පාසල |
| | | | | | | 13. ඒ. ජී. විජේසේන | 13. රවීන්ද්‍ර ජනක කුමාර |
| | | | | | | 14. ගලබඩ පාර | 14. ඩබ්. ආර්. එම්. පුංචිමැණිකේ |
| | | | | | | 15. ජයසුන්දර මැණිකේ | 15. කේ. දයාමැණිකේ |
| | | | | | | 16. එම්. ඒ. ඉන්ද්‍රාවතී | 16. ඩී. එච්. විමලාවතී |
| | | | | | | 17. පුබුටි සෙව්වන්දි | 17. එච්. ඒ. පොඩිකුමාරිහාමි |
| | | | | | | 18. සෝමදාස | 18. ඩබ්. එම්. බිසෝමැණිකේ |
| | | | | | | 19. සිරිසෝම | 19. සමන්ත සාගර මාරසිංහ |
| | | | | | | 20. ජේ. ඒ. සුජාතා | 20. කුමාර ගොඩකුඹුර |
| | | | | | | 21. එම්. කේ. චන්ද්‍රවංශ | 21. ඒ. ජී. ධර්මසේන |
| | | | | | | 22. චන්ද්‍රවංශ | 22. පී. ඒ. තිලකරත්න |
| | | | | | | 23. ජයතිලක | 23. දේවප්‍රිය ප්‍රමෝද් |
| | | | | | | 24. මොන්ටික්‍රිස්ටෝ වත්ත | 24. ලයනල් |
| | | | | | | 25. ඩබ්. ඒ. රවීන්ද්‍ර ලක්සිරි | 25. පන්සල |
| | | | | | | 26. ඩබ්. ඒ. ඩී. වික්‍රමසිංහ | 26. මොන්ටික්‍රිස්ටෝ වත්ත |
| | | | | | | 27. ඩබ්. ඒ. ඩී. මල්ලිකා වික්‍රමසිංහ | 27. ඩබ්. ඒ. ඩී. පුංචිඅප්පුහාමි |
| | | | | | | 28. ආර්. පී. සෝමරත්න | 28. ඩී. කේ. එම්. චන්ද්‍රපාල |
| | | | | | | 29. එච්. බී. ආරියරත්න | 29. විල්බට් අප්පුහාමි |
| | | | | | | 30. එස්. කේ. රත්නායක | 30. එස්. ඩී. රත්නසිරි |
| | | | | | | 31. සුදුබංඩාර | 31. පී. එම්. චිතානන්ද පතිරණ |
| | | | | | | | 32. ආර්. ඩී. ජයරත්න |
| | | | | | | | 33. ඩබ්. ඒ. ඩී. ප්‍රේමාවතී |
| | | | | | | | 34. ඩබ්. ඒ. මහින්ද |
| | | | | | | | 35. බුද්ධික රොහාන් |



06-217

# විවිධ දැන්වීම්

## පාතදුම්බර ප්‍රාදේශීය සභාව

### පස් ප්‍රවාහනය කිරීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය ලබාදීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 120 හා 1982 අංක 04 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ

"11 අ" කොටසේ "8 ඒ" වගන්තිය යටතේ නිකුත් කරනු ලබන පස් ප්‍රවාහන බලපත්‍ර වෙනුවෙන් එක් කාර්තුවක් සඳහා රු. 500ක මුදලක් අයකරනු ලැබේ.

ඩබ්. එම්. එස්. එස්. බී. වෙලගෙදර,<br>
සභාපති,<br>
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ මැයි මස ,<br>
පාතදුම්බර ප්‍රාදේශීය සභාව,<br>
පිටියේගෙදර, වත්තේගම.

06-208/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.